# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2302/39 – 2022 ඔක්තෝබර් 21 වැනි සිකුරාදා – 2022.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 මැයි මස 05 වැනි දින අංක 1861/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 95 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතරින් මෙහි පහත I උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/223.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: WGSWD & EIP/ACQ/MH/08,

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, 526/D - ජම්බුගස්මුල්ල, 535 C පැපිලියාන නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පැපිලියාන -ගංගොඩවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක මු. පි. කො 9623 හා 2016. 04. 08 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්නේ යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක "**18**" – වැලිමැටියේ පිට්ටනියේ ඕවිට – **ප්‍රමාණය: හෙක්. 0.4004**

උතුරට: කැබලි අංක 16, සුනේත්‍රාදේවි පාරේ අංක 426/12/A දරන ඉඩම සහ කො 9467 මූලික පිඹුරේ පිඹුරේ කැබලි අංක 27; නැගෙනහිරට: කො 9467 මූලික පිඹුරේ පිඹුරේ කැබලි අංක 27, 26 සහ කැබලි අංක 19; දකුණට: කැබලි අංක 19 සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම; බටහිරට: කැබලි අංක 17.

EOG 10 – 0189